සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.28

Learning Resource Centre
R
De Mazenod College
Kandana
28558

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

සැ. යු.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා බහුවරණ පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - පාසල් අධ්‍යාපනය අවසන් කළ පැතුම් සංජීව රියදුරු බලපත්‍රය ද ලබාගත්තා ලදී. ඉන්පසු විදේශ රැකියාවක වසර 5ක සේවාකාලයකින් පසු ලංකාවට පැමිණි ඔහු තමන්ගේම ව්‍යාපාරයක් ලෙස "පැතුම් මෝටර්ස්" නමින් ව්‍යාපාරයක් ආරම්භ කර දේශීය මෙන්ම මෙරටට පැමිණෙන විදේශිකයන්ට ද සංචාරක කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සපයයි. ඒ සඳහා ඔහු වෑන්රථ 6ක් යොදවා ඇති අතර, සේවකයින් ද ප්‍රමාණවත් ලෙස බඳවාගෙන ඇත.

01. "පැතුම් මෝටර්ස්" විසින් සපයනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය වන්නේ,
1. විනෝදයයි. 2. ප්‍රවාහනයයි. 3. සන්නිවේදනයයි. 4. අධ්‍යාපනයයි.

02. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය මත මෙම ව්‍යාපාරය අයත් වන්නේ,
1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ලෙසය. 2. සේවා සැපයීමේ ව්‍යාපාරයක් ලෙසය.
3. භාණ්ඩ හා සේවා සැපයීමේ ව්‍යාපාරයක් ලෙසය. 4. සේවා නිෂ්පාදන ව්‍යාපාරයක් ලෙසය.

03. පැතුම් ගේ මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු පනත වන්නේ,
1. 2007 අංක 07 සමාගම් පනත යටතේ ය. 2. 1972 අංක 05 සමුපකාර පනත යටතේ ය.
3. 1918 අංක 06 ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ය. 4. 1890 හවුල් ආඥා පනත යටතේ ය.

04. පෙට්‍රල් හා ඩීසල් මිල දිගින් දිගටම ඉහළ යාම මෙම ව්‍යාපාරයට,
1. ශක්තියකි. 2. දුර්වලතාවයකි. 3. අවස්ථාවකි. 4. තර්ජනයකි.

05. ඉන්ධන හා අමතර කොටස්වල මිල ඉහළයාම මත පැතුම් මෝටර්ස් ව්‍යාපාරයේ ප්‍රවාහන ගාස්තු ඉහළයාම අයත්වන ව්‍යාපාර පරිසරය වන්නේ,
1. ආර්ථික පරිසරය 2. දේශපාලන පරිසරය 3. නෛතික පරිසරය 4. ගෝලීය පරිසරය

06. ධම්මික, සරුබිම ව්‍යාපෘතිය යටතේ තම ගෙවත්තේ වගා කරන වස විසෙන් තොර කෙසෙල් ප්‍රදේශය පුරා තම යතුරුපැදිය භාවිතා කරමින් අලෙවි කරයි. ධම්මික,
1. සංචාරක සුළු පරිමාණ තොග වෙළෙන්දා ය. 2. සංචාරක සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දා ය.
3. ස්ථාවර සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දා ය. 4. ස්ථාවර මහාපරිමාණ සිල්ලර වෙළෙන්දා ය.

07. ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික පරිසර සාධකයක් වන්නේ,
1. යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්තියයි. 2. අයවැය ප්‍රතිපත්තියයි.
3. විදේශ විනිමය අනුපාතයයි. 4. විවෘත ආර්ථික ප්‍රතිපත්තියයි.

08. පහත දැක්වෙන පනත් වලින් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අදාල වන පනත් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

A - 2007 අංක 07 සමාගම් පනත
B - 1972 අංක 05 සමුපකාර සමිති පනත
C - 1890 හවුල් ආඥා පනත
D - 1840 වංචා වැලැක්වීමේ ආඥා පනත

1. ABC පමණි. 2. ABD පමණි. 3. ACD පමණි. 4. CAB පමණි.

09. පෙරේරා සහ සමාගම අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. සංස්ථාපිත සමාගම් 2. හවුල් ව්‍යාපාර 3. රාජ්‍ය සමාගම් 4. ඒක පුද්ගල ව්‍යාපාර

10. පහත X තීරුවේ ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් ද Y තීරුවේ ඒවායේ ලක්ෂණ කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ඒකපුද්ගල ව්‍යාපාර | A - උපරිම සාමාජික සංඛ්‍යාව 20 කි. |
| 2. හවුල් ව්‍යාපාර | B - තීරණ ගැනීමේ ස්වාධීන බව |
| 3. සමිති සංවිධාන | C - සාමාජික සුභසාධනය අරමුණු කර තිබීම. |
| 4. සංස්ථාපිත සමාගම් | D - කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කිරීම. |

ඉහත X තීරුව Y තීරුව සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1. ABCD 2. BCDA 3. BACD 4. CDAB

11. තොග වෙළඳාමේ ලක්ෂණයක් වන්නේ,

1. අවසාන පාරිභෝජනයට භාණ්ඩ විකිණීමයි.
2. විවිධ භාණ්ඩ වර්ග අලෙවි කිරීමයි.
3. සාපේක්ෂව ඒකක විකුණුම් මිල වැඩි වීමයි.
4. නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීමයි.

12. ගනුදෙනුකරුවෙකුට ණය පදනම මත බැංකුවක් විසින් නිකුත් කරනු ලබන විද්‍යුත් කාඩ්පත වන්නේ,

1. හර කාඩ්පත ය.
2. පෙර ගෙවුම් කාඩ්පත ය.
3. ණය කාඩ් පත ය.
4. ස්වංක්‍රීය ටෙලර් කාඩ්පත ය.

13. ව්‍යාපාරයක අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා අදාළවන පාර්ශව පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

1. අයිතිකරුවන්, පාරිභෝගිකයන් හා සිල්ලර වෙළෙඳුන් ය.
2. අයිතිකරුවන්, කළමනාකරුවන් හා සේවකයින්ය.
3. කළමණාකරුවන්, සේවකයින් හා පාරිභෝගිකයන් ය.
4. කළමණාකරුවන්, සිල්ලර වෙළෙඳුන් හා මූල්‍ය ආයතනය.

14. රුවන් තම ව්‍යාපාර ආයතනය පුළුල් කිරීම සඳහා නව සේවකයින් පස්දෙනෙකු බඳවාගැනීමට තීරණය කිරීම අයත් වන්නේ කළමණාකරණයේ

1. සැලසුම්කරණයටය. 2. සංවිධානකරණටය. 3. මෙහෙයවීමටය. 4. පාලනයට ය.

15. අලෙවිකරණ මිශ්‍රයේ මිල නැමැති විචල්‍යයට අයත් වන අයිතම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ප්‍රචාරණය, ප්‍රවාහනය, මෝස්තරය
2. වට්ටම්, ණය කොන්දේසි, ගෙවීම් ක්‍රම
3. ඇසුරුම්, ණය කොන්දේසි, ගෙවීම් ක්‍රම
4. මෝස්තරය, වට්ටම්, දීමනා

16. පහත සඳහන් ආයෝජන මාර්ග අතුරෙන් අවදානම අඩුම ආයෝජන මාර්ගය කුමක්ද?

1. ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම.
2. දේපල මිලදී ගැනීම
3. භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම
4. සාමාන්‍ය කොටස් මිලදී ගැනීම.

17. ව්‍යාපාරයක සිදුවන විවිධ ස්වරූපයේ ගනුදෙනු හා සිදුවීම් අතුරෙන් ගිණුම්කරණයේ දී සැලකිල්ලට ගනු ලබන්නේ,

1. සියලු ගණුදෙනු හා සිදුවීම් ය.
2. ණයට සිදුවන ගණුදෙනු පමණි.
3. මුදලින් මැනිය හැකි ගණුදෙනු හා සිදුවීම් ය.
4. අත්පිට සිදුවන ගණුදෙනු පමණි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක 18 හා 19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2023. 05. 01 දිනට දේවිකාගේ ලී බඩු අලෙවි ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත දක්වේ.

- ගොඩනැගිලි රු: 300,000
- ණය ගැතියෝ රු: 20,000
- ණය හිමියෝ රු: 25,000
- විකිණීමට තබා ඇති ලී බඩු රු: 100,000
- බැංකු ණය රු: 50,000
- මෝටර් රථය රු: 200,000

18. දේවිකාගේ ලී බඩු වෙළඳ ව්‍යාපාරයේ 2023. 05. 01 දින ප්‍රාග්ධනය වන්නේ,
1. රු: 545,000 ය. 2. රු: 570,000 ය. 3. රු: 595,000 ය. 4. රු: 620,000 ය.

19. 2023. 05. 01 දිනට ඉහත සඳහන් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම වන්නේ,
1. රු: 200,000 2. රු: 300,000 3. රු: 500,000 4. රු: 600,000

20. ව්‍යාපාරයකට භාණ්ඩ තොගයක් ණයට ගැනීමෙන් එම ව්‍යාපාරයේ
1. වත්කම් හා වියදම් වැඩිවේ. 2. වත්කම් හා ප්‍රාග්ධනය වැඩිවේ.
3. වත්කම් වැඩිවී වගකීම් අඩුවේ. 4. වත්කම් හා වගකීම් වැඩිවේ.

21. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත සඳහන් පරිදි විය.
වත්කම් (රු: 150,000) = හිමිකම් (රු: 100,000) + වගකීම් (රු: 50,000)
මෙම ව්‍යාපාරයට රු: 50,000ක් වූ යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය දක්වෙන්නේ,
1. වත්කම් 200,000 = හිමිකම් 150,000 + වගකීම් 50,000
2. වත්කම් 200,000 = හිමිකම් 100,000 + වගකීම් 100,000
3. වත්කම් 150,000 = හිමිකම් 100,000 + වගකීම් 50,000
4. වත්කම් 150,000 = හිමිකම් 50,000 + වගකීම් 100,000

22. අඩුවීම හර, වැඩිවීම බැර යන ගිණුම්කරණ මූලධර්මය පෙන්වන ගිණුම් දෙකක් වන්නේ,
1. ප්‍රාග්ධන ගිණුම හා ණය හිමි ගිණුම 2. බැංකු ගිණුම හා ණයගැති ගිණුම
3. රක්ෂණ ගාස්තු ගිණුම හා බැංකු පොලී ගිණුම 4. වත්කම් ගිණුම හා වියදම් ගිණුම

23. ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා රු: 50,000ක ලී බඩු උපකරණ ඒ. එච්. කුරේ සමාගමෙන් ණයට ගැනීම වාර්තා කරන මූලික සටහන්පොත වන්නේ,
1. ගැනුම් ජ'නලයයි. 2. පොදු ජ'නලයයි. 3. මුදල් පොතයි. 4. බැංකු ගිණුමයි.

24. ව්‍යාපාරයක අයිතිකරු ගැනිලි සිදුකල විට (1) ..................................... අඩු වී (2)..................................... අඩුවේ.
(1) හා (2) හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වන්නේ,
1. මුදල්, වත්කම් 2. වත්කම්, වගකීම්
3. වත්කම්, හිමිකම් 4. ප්‍රාග්ධනය, වගකීම්

25. ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනුවකට අදාල ද්විත්ව සටහනක් පහත දක්වේ.

මෝටර් රථ ගිණුම හර රු: 300,000

ප්‍රාග්ධන ගිණුම බැර රු: 300,000

ඉහත ද්විත්ව සටහනට අදාළ ගණුදෙනුව තෝරන්න.
1. අයිතිකරු ව්‍යාපාරයට රු: 300,000 ක මුදලක් යෙදීම
2. රු: 300,000ක වත්කමක් මිලදී ගැනීම
3. රු: 300,000 ක් වටිනා මෝටර් රථයක් ණයට ගැනීම
4. අයිතිකරු රු: 300,000 ක් වටිනා මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම.

26. අතුල ගේ ව්‍යාපාරයේ 2023 සැප්තැම්බර් 01 දිනට සුළු මුදල් භාරකරු සතුව තිබූ මුදල රු: 140 කි. එදින ප්‍රධාන මුදල් භාරකරු විසින් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු: 1360 ලබාදෙන ලදී. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම වන්නේ,
1. රු: 140 යි. 2. රු: 1360 යි. 3. රු: 1500 යි. 4. රු: 1640 යි.

27. බැංකු ප්‍රකාශනයක හර තීරුවේ දක්වෙන අයිතමයක් වන්නේ,

1. ණය ගැති ප්‍රේෂණය 2. මුදල් තැන්පතුය. 3. චෙක්පත් තැන්පතුය. 4. බැංකු ගාස්තුය.

28. 2023. 06. 30 දිනට බැංකුව විසින් ව්‍යාපාරය වෙත එවා ඇති බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු: 27,000 ක් විය. ව්‍යාපාරය විසින් එම බැංකු ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී බැංකුව වැරදීමකින් රු: 7,000ක් ව්‍යාපාරයේ ගිණුමට බැර කර ඇත. ව්‍යාපාරයට අනුව 2023. 06. 30 දිනට බැංකු ජංගම ගිණුමේ පැවතිය යුතු නිවැරදි ශේෂය වන්නේ,

1. රු: 7,000 2. රු: 20,000 3. රු: 27,000 4. රු: 34,000

29. ගැණුම් ජ'නලයේ සටහන් කළ ගණුදෙනු ලෙජරයට පිටපත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. ණයගැති ගිණුම හර ගැණුම් ගිණුම බැර
2. ණයහිමි ගිණුම හර ගැනුම් ගිණුම බැර
3. ගැණුම් ගිණුම හර ණයහිමි ගිණුම බැර
4. ගැණුම් ගිණුම හර ණයගැති ගිණුම බැර

30. ශේෂ පිරික්සුමක බැර තීරුවේ ඇතුලත්වන ගිණුම් ශේෂ පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. ප්‍රචාරණය, ණය පොලී, සේවක වේතන
2. කඩකුලී ආදායම්, ගැනිලි, විකුණුම්
3. බැංකු ණය, ණයහිමියෝ, ලද කොමිස්
4. යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, ලීබඩු

31. ව්‍යාපාරයක මාසික කඩකුලී වියදම රු: 9,000කි. 2023. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කඩකුලී ලෙස ගෙවා තිබුණේ රු: 90,000ක් පමණි. 2023. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපචිත කඩකුලී වටිනාකම වන්නේ,

1. රු: 9,000කි. 2. රු: 10,000 කි. 3. රු: 12,000කි. 4. රු: 18,000කි.

32. ප්‍රාථමික පිරිවැය නිවැරදිව දක්වෙන භාණ්ඩය තෝරන්න.

1. සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, පොදු කාර්ය පිරිවැය
2. වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, සෘජු වෙනත් පිරිවැය
3. සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, මුළු සෘජු පිරිවැය
4. සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් පිරිවැය

- පහත දක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 33 හා 34 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- "ජයහඬ" ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200ක් වන අතර, එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු: 1000කි. සාමාජිකයන් දහදෙනෙකු 2023. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත.

33. ජයහඬ ක්‍රීඩා සමාජයේ 2023. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල කීයද?

1. රු: 190,000 2. රු: 200,000 3. රු: 210,000 4. රු: 220,000

34. ජයහඬ ක්‍රීඩා සමාජයේ 2023. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශය තුල ඇතුළත් කළ යුතු සාමාජික මුදල වන්නේ,

1. රු: 190,000 2. රු: 200,000 3. රු: 210,000 4. රු: 220,000

2024.02.28

- **පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

285177

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් | | 500,000 |
| ගැණුම් | 300,000 | |
| 2022. 01. 01 දිනට තොගය | 150,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | 1,200,000 | |
| 10% බැංකු ණය | | 100,000 |
| මුදල් ශේෂය | 25,000 | |
| රක්ෂණ ගාස්තු | 3,000 | |
| ණය ගැතියෝ | 37,000 | |
| ණය හිමියෝ | | 20,000 |
| කඩ කුලී ආදායම් | | 30,000 |
| විදුලි ගාස්තු | 15,000 | |
| බැංකු ණය පොලී | 5,000 | |
| 2022. 01. 01 දිනට ප්‍රාග්ධනය | | 1,085,000 |
| | 1,735,000 | 1,735,000 |

Learning Resource Center
R
De Mazenod College
Kandana

අතිරේක තොරතුරු
1. 2022. 12. 31 දිනට ඉතිරි තොගය රු: 60,000
2. 2022. 12. 31 දිනට විදුලිය ගාස්තු රු: 2,000 උපචිතව ඇත.
3. 2022. 12. 31 දිනට ණයගැතියන්ගෙන් රු: 7,000ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

35. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකිණීමට ඉදිරිපත්කල භාණ්ඩවල පිරිවැය
    1. රු: 390,000    2. රු: 450,000    3. රු: 510,000    4. රු: 560,000

36. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය
    1. රු: 110,000    2. රු: 140,000    3. රු: 390,000    4. රු: 450,000

37. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය
    1. රු: 73,000    2. රු: 100,000    3. රු: 103,000    4. රු: 140,000

38. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට මුළු වත්කම්වල වටිනාකම
    1. රු: 103,000    2. 108,5000    3. රු: 120,000    4. 127,000

39. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට මුළු වත්කම්වල වටිනාකම
    1. රු: 103,000    2. රු: 108,500    3. රු: 1,188,000    4. රු: 1,315,000

40. සංජීවගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට හිමිකම
    1. රු: 1,188,000    2. රු: 1,200,000    3. රු: 1,315,000    4. රු: 1,388,000

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.28

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Dr Mazenod College Kandana 28501

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name .................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

සැ.යු.

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ගම්පහ පදිංචි මිරාන් පාරම්පරික ඉඩම්හිමි වැවිලිකරුවෙකි. පොල්තෙල් නිෂ්පාදනය පිළිබඳ හයමාසික වෘත්තිය පුහුණු පාඨමාලාවක් ද හදාරා ඇත. ගම්පහ ප්‍රදේශයේ විශාල දේපළක් පිය උරුමයෙන් හිමි වූ මිරාන් අක්කර 10ක භූමි ප්‍රමාණයක පොල් වගාකර මේ වනවිට එළදාවද ලබා ගනියි. පොල් අලෙවි කිරීමට අමතරව පොල්තෙල් නිෂ්පාදනය පිළිබඳව ද ඔහු අවධානය යොමුකර 2023. 01. 01 දින රු: 1,500,000ක් යොදා පොල්තෙල් නිෂ්පාදන ව්‍යාපාරයක් ''මිරා කොකනට් ඔයිල්'' නමින් තමන්ගේම ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. එදිනම 10%ක වාර්ෂික පොලියකට රු: 1,200,000 ක බැංකු ණයක් ලබාගෙන රු: 800,000 ක් වටිනා යන්ත්‍රයක් හා 300,000 ක අවශ්‍ය උපකරණ ද මිලදී ගන්නා ලදී.

ව්‍යාපාරයකට අවශ්‍ය සේවකයන් දෙදෙනෙකු 2023. 01. 02 බඳවාගන්නා ලද අතර, කළමනාකරුවෙකු බඳවාගැනීමට ද තීරණය කරන ලදී. තම පොල්වත්තේ පොල් වේලා ගැනීම මෙන්ම පොල් මිලදී ගැනීමත් මෙම ව්‍යාපාරය සිදු කරයි. ඊට අමතරව අවට ප්‍රදේශවලින් ඉවතලන වේලාගත් පොල්කුඩු මිලට ගැනීමත් සිදුකරන ලදී.

2023. 01. 31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

| | රු: |
|---|---|
| පොල් මිලදී ගැනුම් | 150,000 |
| සේවක වැටුප් ගෙවීම | 40,000 |
| පොල් කුඩු මිලට ගැනුම් | 80,000 |
| පොල්තෙල් විකුණුම් | 450,000 |
| මෝටර් රථ (ලොරි) කුලී | 15,000 |
| විදුලි බිල ගෙවීම | 10,000 |

අමතර තොරතුරු

- යන්ත්‍ර වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ජනවාරි මාසයේ බැංකු ණය පොලිය ගෙවා නැත.
- 2023. 01. 31 දිනට පොල්, පොල්කුඩු හෝ පොල්තෙල් කිසිවක් ඉතිරි වී නැත.

මේ දිනවල පොල් එළදාව අඩුවීම නිසා පොල් මිල ඉහල යාම හා පොල්තෙල් මිලද ඉහල යාම සිදු වී ඇත.

i. අ. ''මිරා කොකනට් ඔයිල්'' ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
   ආ. ''මිරා කොකනට් ඔයිල්'' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් දක්වන්න.

ii. ව්‍යාපාර හිමිකරත්වය අනුව මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ඇති වාසි දෙකක් නම් කරන්න.

iii. අ. මිරා කොකනට් ඔයිල් ව්‍යාපාරයේ ශක්තියක් හා තර්ජනයක් නම් කරන්න.
   ආ. මෙම ව්‍යාපාරය දියුණු කිරීම සඳහා මිරාන් ගේ දායකත්වයන් දෙකක් නම් කරන්න.

iv. මීරා කොකනට් ඔයිල් ව්‍යාපාරය ඇසුරෙන් පහත සඳහන් කළමනාකරණ කාර්ය සඳහා නිදසුන බැගින් ලියන්න.

අ. සැලසුම්කරණය ආ. සංවිධානකරණය

v. අ. 2023. 01. 01 දිනට මීරා කොකනට් ඔයිල් ව්‍යාපාරයේ හිමිකම් හා වගකීම්වල වටිනාකම වෙන වෙනම ලියන්න.

ආ. බැංකු ණය මුදල ලබාගැනීමට අදාල ද්විත්ව සටහන වටිනාකම සහිතව ලියන්න.

vi. අ. මෙම ව්‍යාපාරයේ 2023. 01. 31 දිනට උපචිත ණයපොලිය සටහන් කිරීමට අදාල නිවැරදි ජ'නල සටහන දක්වන්න.

ආ. "මීරා කොකනට් ඔයිල්" ව්‍යාපාරය විසින් පිළියෙල කලයුතු මූලික සටහන් පොත් දෙකක් සඳහන් කරන්න.

vii. 2023. 01. 01 දිනට ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

viii. 2023. 01. 31 දිනට මීරා කොකනට් ඔයිල් ව්‍යාපාරයේ අත ඉතිරි මුදල ගණනය කරන්න.

ix. මීරා කොකනට් ඔයිල් ව්‍යාපාරයේ 2023. 01. 31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

x. 2023. 01. 31 දිනට "මීරා කොකනට් ඔයිල්" ව්‍යාපාරයේ මුළු වත්කම් හා හිමිකම ගණනය කරන්න.

(ල. 2 × 10 = 20)

## I - කොටස
### ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

02. i. ඒක පුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක ඇති වාසි දෙකක් ලියන්න. (ල. 2)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

අ. මිනිස් අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැක.

ආ. හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් සංඛ්‍යාව තීරණය කරනුයේ සමාගම් පනත මගිනි.

ඉ. ලාභ අපේක්ෂිත ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලෙස පාරිභෝගික තෘප්තිය ඉහල නැංවීම හඳුනාගත හැක.

ඊ. පවරන ලද කාර්යය නිසි ලෙස ඉටු කිරීම සේවකයින්ගේ අරමුණකි.

(ල. 2)

iii. රජයේ පාසලක් වන බින්තැන්න මහා විද්‍යාලය ප්‍රදේශයට විශාල මෙහෙවරක් ඉටු කරයි. අධ්‍යාපනික මෙන්ම සමාජ සුභසාධන අංශයෙන් ද ඉටුකරන මෙහෙවර ප්‍රදේශයට මහගු සේවාවකි. මෙම සියලු කාර්යයන් වලදී පාසල් සංවර්ධන සමිතිය ඉටුකරන්නේ විශාල කාර්යභාරයකි.

අ. බින්තැන්න පාසලේ සිසුන්ට එම පාසල විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

ආ. ඉහත පාසලේ පිහිටුවා ඇති පාසල් සංවර්ධන සමිතිය, අරමුණ අනුව කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේද?

(ල. 2)

iv. ජයමාල් මොරටුව ප්‍රදේශයේ දක්ෂ කැටයම් ශිල්පියෙකි. නවීන තාක්ෂණික යන්ත්‍ර හා උපකරණ යොදාගෙන, දැව භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම අලංකාර කැටයම් නිර්මාණයට සහජ දක්ෂතා ඇති ඔහු තම ව්‍යාපාරය සඳහා දිනුත් සහ නිවන්ත යන සේවකයින් ද බඳවාගෙන ඇත. නිවාස අලංකරණය සඳහා අවශ්‍ය අලුත්ම මාදිලියේ විසිතුරු කැටයම් නිෂ්පාදන ඔහු විසින් නිර්මාණය කර ඇත. හොඳ වෙළඳපළක් ද මේ වන විට ඔහු දිනාගෙන ඇත. ඔහුගේ ව්‍යාපාරය "ශානි කැටයම්" ලෙස නම් කර ඇත.

අ. ඉහත සිද්ධියේ ඇති තොරතුරු වලින් පහත දක්වෙන නිෂ්පාදන සාධක සඳහා නිදසුන් ලියා දක්වන්න.

- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසායකත්වය

ආ. "ශානි කැටයම්" ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ද හේතු දක්වන්න. (ල. 2)

(මුළු ල. 08)

03. i. සුළු පරිමාණ ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

අ. ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය ආයතන නියාමනය කරන ප්‍රධාන ආයතනය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

ආ. ශ්‍රී ලංකාව චීනයෙන් රෙදිපිළි මිලදී ගැනීම අපනයන වෙළඳාමට නිදසුනකි.

ඉ. චෙක්පතක් ලියා අත්සන් කරන පාර්ශවය වන්නේ අණකරුය.

ඊ. රක්ෂණය සලකනු ලබන්නේ අවදානම් වලක්වා ගැනීමක් ලෙසයි.

iii. පාසලේ දී ශිෂ්‍යයෙකු හදිසියේ අසනීප විය. අසනීප වූ මයුර ගේ පියාට පංති භාර ලලනි ගුරු මහත්මිය විසින් දුරකථනය මගින් ඒ බව දන්වන ලදී. පාසලට ආසන්න ආයතනයක සේවය කරන එම පියා ඉතා ඉක්මනින් පාසලට පැමිණෙන බව දන්වන ලදී.

අ. මෙම සිද්ධියේ සඳහන් යවන්නා, පණිවුඩය, ලබන්නා හා ප්‍රතිචාරය සඳහා උදාහරණ දක්වන්න.

ආ. මෙම සිද්ධියේ සඳහන් සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදන ක්‍රමය ලියා දක්වන්න.

iv. සිතුම් තම ලොරි රථය යොදාගෙන එළවළු වර්ග මොරටුව ප්‍රදේශය පුරා අලෙවිකරණ අතර සෑම දිනකම සවස් භාගයේ දී මොරටුව දුම්රියපල ඉදිරිපිට ලොරි රථය නවතා දුම්රියෙන් බැසයන මගීන් ඉලක්ක කර ගනිමින් තම ව්‍යාපාර කටයුත්ත සිදු කරයි.

අ. ඉහත සිද්ධියට අනුව එහි සඳහන් මාර්ගය, මාධ්‍ය, බලය පර්යන්තය යන ප්‍රවාහනයේ මූලිකාංග සඳහා උදාහරණ දක්වන්න.

ආ. දුම්රිය ප්‍රවාහනයේ වාසි 02ක් හා අවාසි 02ක් ලියන්න.

04. i. අලෙවිකරණය යනු කුමක් ද?

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. ව්‍යාපාරයක සම්පත් වෙන් කිරීම, තනතුරු ඇති කිරීම, සංවිධානකරණයට අයත් වේ.

ආ. සංවිධානයක අරමුණු අපේක්ෂිත ආකාරයෙන්ම ඉටුකර ගැනීම සඵලදායිත්වයයි.

ඉ. ආයෝජනයක අවදානම හා ප්‍රතිලාභය අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධයකි.

ඊ. මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් ගිණුමක මුදල් තැන්පත් කිරීම අවිධිමත් ආයෝජන මාර්ගයකි.

iii. සමන් තම රැකියාවෙන් ඉතිරිකර ගත් රු: 8,000,000 මුදල් යොදවා පෞද්ගලික මූල්‍ය ආයතනයක වාර්ෂිකව 26%ක පොලියක් අපේක්ෂාවෙන් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කරන ලදී. නමුත් ස්ථාවර තැන්පතු පොලී අනුපාතය මහ බැංකුව විසින් පහළ දමන ලදී.

අ. ඉහත සිද්ධිය ඇසුරෙන් ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක දෙකක් නම් කරන්න. (උදා: සහිතව)

ආ. ආයෝජනය යනු කුමක් ද?

iv. පසුගිය කාලය තුළ ස්ථාවර තැන්පත් පොලී අනුපාතය සීඝ්‍රයෙන් ඉහලයාම නිසා ආයෝජකයන් ස්ථාවර තැන්පත් ආරම්භ කිරීමට වැඩි කැමැත්තක් දක්වන ලදී.

අ. ස්ථාවර තැන්පතුවක් යනු කුමක් ද?

ආ. ස්ථාවර තැන්පතුවක ආයෝජනයෙන් ලැබෙන වාසි දෙකක් නම් කරන්න.

## II කොටස
## ගිණුම්කරණය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

05. i. ගණුදෙනුවක් යනු කුමක් ද? (ල. 2)

ii. ව්‍යාපාරයක සිදු වූ පහත සඳහන් එක් එක් ගණුදෙනුව සටහන් කිරීම සඳහා භාවිතා කරන නිවැරදි ද්විත්ව සටහන ලියා දක්වන්න.

අ. රුඃ 200,000 ක ප්‍රාග්ධනයක් අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම

ආ. රුඃ 50,000 ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනයට සේන සමාගමෙන් ණයට ගැනීම (ල. 2)

iii. සාලියගේ ව්‍යාපාරයෙ 2023. 01. 01 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පහත දක්වේ.

| | රුඃ |
|---|---|
| යන්ත්‍රසූත්‍ර | 400,000 |
| භාණ්ඩ තොගය | 120,000 |
| ණයගැතියෝ | 80,000 |
| මුදල් ශේෂය | 50,000 |
| බැංකු ණය | 150,000 |
| ණය හිමියෝ | 40,000 |

2023 ජනවාරි මාසය තුල සාලියගේ ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වේ.

| දිනය | වත්කම් (රුඃ) | | | | හිමිකම් | වගකීම් (රුඃ) | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍රසූත්‍ර | භාණ්ඩ තොගය | ණය ගැතියෝ | මුදල් | රු. | බැංකු ණය | ණයහිමියෝ |
| 01/03 | | +5000 | | | | | +5000 |
| 01/10 | | | -10,000 | +10,000 | | | |
| 01/21 | | | | -20,000 | -20,000 | | |
| 01/30 | | | | +50,000 | | +50,000 | |

අවශ්‍ය වන්නේ

අ. ගිණුම්කරණ සමීකරණයට ආදේශ කර ඇති එක් එක් ගණුදෙනුව විස්තර කරන්න.

ආ. 2023. 01. 31 දිනට හිමිකම ගණනය කරන්න. (ල. 4)

iv. සංජීවගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මායේ ණයට විකුණුම් පිළිබඳ ගණුදෙනු පහත දක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම (රුඃ) |
|---|---|---|---|
| 2023/01/08 | 42 | වගීශා | 15,000 |
| 2023/01/20 | 60 | නෙත්මි | 12,000 |
| 2023/01/28 | 64 | ඩිලක්ෂි | 20,000 |

අවශ්‍ය වන්නේ

අ. ඉහත ගණුදෙනු සංජීවගේ ව්‍යාපාරයේ විකුණුම් ජ්'නලයේ සටහන් කිරීම

ආ. 2023. 01.31 දිනට විකුණුම් ජ්'නලයේ ගණුදෙනු අදාල ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම.

(ල. 4)

(මුළු ල. 12)

28495

06. i. අ. ප්‍රාථමික පිරිවැය යනු කුමක් ද?

ආ. "රුවන් ලී බඩු" නිෂ්පාදන ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ නිෂ්පාදන පිරිවැය තොරතුරු කිහිපයක් පහත දක්වේ.

| | රු: |
|---|---|
| දැව මිලට ගැනුම් | 50,000 |
| මුරකරු වැටුප | 15,000 |
| විදුලි ගාස්තු | 5,000 |
| වඩුකාර්මික වැටුප | 12,000 |
| ඇණ, ගම් හා අනෙකුත් ද්‍රව්‍ය | 8,000 |
| යන්ත්‍ර ක්ෂය | 2,000 |

අවශ්‍ය වන්නේ,

- රුවන් ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ ප්‍රාථමික පිරිවැය ගණනය කිරීම.
- එම ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ පොදු කාර්ය පිරිවැය ගණනය කිරීම. (ල. 4)

ii. සිතුම් ගේ ව්‍යාපාරයේ මාසික සුළු මුදල් අග්‍රිමය රු: 4,000 කි. 2023 ජනවාරි මාසයේ සුළු මුදල් සම්බන්ධ තොරතුරු පහත දක්වේ.

| | | රු: |
|---|---|---|
| 01/01 | අත ඉතිරි | 300 |
| 01/01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | |
| 01/03 | බස් කුලී | 120 |
| 01/06 | ලිපි ලියාපදිංචි ගාස්තු | 80 |
| 01/10 | ⁄4 කඩදාසි | 250 |
| 01/14 | ගෙන ඒමේ කුලී | 400 |
| 01/19 | සංග්‍රහ වියදම් | 100 |
| 01/23 | කාර්යාල රාක්ක | 800 |
| 01/24 | කුලී රථ ගාස්තු | 200 |
| 01/26 | මුද්දර හා ලිපි කවර | 140 |
| 01/28 | පිරිසිදු කිරීමේ කුලී | 100 |
| 01/29 | නිමල්ට වැටුප් අත්තිකාරම් | 500 |
| 01/30 | පෑන් පැන්සල් | 200 |

අවශ්‍ය වන්නේ,

අ. ගමන්, තැපැල්, ලිපි, විවිධ වියදම් හා ලෙජර් ගිණුම් යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත පිළියෙල කිරීම. (ල. 4)

iii. සියත් ගේ ව්‍යාපාරයේ 2023. 05. 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු: 28,500 ක් විය. නමුත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය මීට වෙනස් විය. වෙනසට හේතු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. තැන්පත් කල නමුත් බැර නොවූ චෙක්පත් (උපලබ්ධි නොවූ) | රු: | 4,000 |
| 2. බැංකුව අයකල ගාස්තු | රු: | 500 |
| 3. බැංකුවට සෘජුවම ලද ලාභාංශ | රු: | 2,800 |
| 4. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | රු: | 6,400 |

අවශ්‍ය වන්නේ,

අ. 2023. 05. 31 දිනට සංශෝධිත බැංකු ගිණුම ආ. 2023. 05. 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය (ල. 4)

iv. කුමුදුගේ ව්‍යාපාරයේ 2023. 12. 31 දිනට පැවති ගිණුම් ශේෂය පහත දක්වේ.

| | රු: |
|---|---|
| 01/01 භාණ්ඩ තොගය | 50,000 |
| ආයෝජන | 600,000 |
| දුන් වට්ටම් | 12,000 |
| ලද වට්ටම් | 6,000 |
| ගැනුම් | 80,000 |
| විකුණුම් | 120,000 |
| බැංකු අයිරාව | 60,000 |
| මුදල් | 40,000 |

2023. 12. 31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කර එදිනට ප්‍රාග්ධනය ගණනය කරන්න. (ල. 4)

(මුළු ල. 12)

2024.02.28

07. i. "අපි දිනමු" ක්‍රීඩා සමාජයේ 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට සපයයි.

| | |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් | රුː 15,000 |
| තරඟ වියදම් | රුː 6,000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනුම් | රුː 3,000 |
| පරිත්‍යාග ලැබීම් | රුː 25,000 |

- 2022/01/01 දින මුදල් ශේෂය රුː 18,000
- සමිතියේ සාමාජික සංඛ්‍යාව 250ක් වන අතර, එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රුː 100 කි.

අවශ්‍ය වන්නේ,

අ. 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

ආ. 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (ල. 4)

ii. කවීෂාගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දක්වේ.

| | හර | බැර |
|---|---|---|
| දළ ලාභය | | 80,000 |
| ප්‍රාග්ධනය 2022. 01. 01 දිනට | | 120,000 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 6,000 | |
| ප්‍රචාරණය | 12,000 | |
| වරිපනම් ගාස්තු | 7,000 | |
| බැංකු ගාස්තු | 4,000 | |
| තොගය 2022. 12.31 දිනට | 40,000 | |
| 10% බැංකු ණය | | 100,000 |
| ණයගැතියෝ | 40,000 | |
| ණය හිමියෝ | | 20,000 |
| යන්ත්‍ර (පිරිවැයට) | 200,000 | |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් (2022. 01. 01 දිනට) | | 5,000 |
| රක්ෂණ ගාස්තු | 12,000 | |
| විදුලි ගාස්තු | 3,000 | |
| ගොඩනැගිලි කුලී | 10,000 | |
| ලද වට්ටම් | | 5,000 |
| දුන් වට්ටම් | 5,000 | |
| බැංකු ණය පොලී | 6,000 | |
| බැංකු ශේෂය | | 15,000 |
| | 345,000 | 345,000 |

අමතර තොරතුරු

- ණයගැතියන්ගෙන් රුː 1000ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.
- යන්ත්‍ර 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කල යුතුය.
- 2022/12/31 දිනට ගෙවිය යුතු රක්ෂණ ගාස්තු රුː 2,000 කි.

Training Resource Centre
R
De Mazenod College
Kandana

අවශ්‍ය වන්නේ,

අ. 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කවීෂාගේ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය

ආ. 2022/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල. 8)

(මුළු ල. 12)